THE EDUCATION STATE



# බාලාංශ දරුවන් හට ඉගෙනීමට දැඩි ආශාවක් ඇත

## බාලාංශය යනු කුමක්ද?

බාලාංශය යනු දරුවන්ගේ පාසැල් කාලය ඇරඹීමට පෙර ඔවුනට ඇති අධ්‍යාපන වැඩ සටහනකි.

බාලාංශ වැඩසටහන්වල ඉගැන්වීම සිදු කරන්නේ උපාධි සුදුසුකම් ඇති ගුරුවරුන් විසිනි. බාලාංශයේදී ඔබගේ දරුවා හට සිය පාසැලට යාමට සුදානම්වීම සඳහා අවශ්‍ය වැදගත් කුසලතා ලබාදේ.

## මාගේ දරුවා හට බාලාංශ වැඩ සටහනක් වැදගත් වන්නේ ඇයි?

බාලාංශය වෙත යන දරුවන් තුල කියවීම, ගණන් කිරීමට ඉගෙනීම, අංක හඳුනා ගැනීම, සහ ගැටළු විසඳන ආකාරය වැනි සියළු අනාගත ඉගෙනීම්වලට පදනම ලබා දෙන කුසලතා වර්ධනයවේ. ඔබගේ දරුවා ක්‍රීඩාව මගින් ඉගෙන ගන්නේය යන්න පර්යේෂණ මගින් පෙන්වා දී ඇති ආකාරයට කුඩා දරුවන් හට ඉගැන්විය හැකි හොඳම ආකාරයවේ. බාලාංශයේදී, ඔබගේ දරුවා හට නව මිතුරන් හමුවන අතර එ මගින් විශ්වාසය සහ ස්වාධීනත්වය ගොඩ නැගේ.

## බාලාංශ වැඩ සටහන ලබා දෙන්නේ කා විසින්ද?

බාලාංශ වැඩ සටහන් බොහෝ දිගු දිවා රැකවරණ සේවා මධ්‍යස්ථානවල ඇති අතර තනිව පවත්වා ගෙන යන බාලාංශ වැඩ සටහන්ද ඇත.

## මාගේ දරුවා සඳහා හොඳම බාලාංශ වැඩ සටහන තෝරා ගන්නේ කෙසේද?

සේවා සපයන්නා රජයේ අරමුදල් ලබන්නේද යන්න සොයා බැලීම වැදගත්වේ - සේවාවේ ‘අරමුදල් ලබා දෙන බාලාංශ’ යන සහතිකය ප්‍රදර්ශනය කර ඇතිද යන්න සොයා බලන්න.

රජය මගින් බාලාංශ සහ දිගු දිවා රැකවරණ සේවා ජාතික ගුණාත්මක රාමුව යටතේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ඇගයීමක් කරන අතර සෑම සේවාවකටම ගුණාත්මක ඇගයීමක් ලබාදේ. සෑම සේවාවක්ම සිය ඇගයීම ප්‍රදර්ශනය කල යුතුය. සේවාව විසින් ලබා ඇති ඇගයීම ඔබට පෙන්වන ලෙස හෝ ඔවුන් විසින් ලබා ඇති ඇගයීම ඔබට පවසන ලෙස හෝ ඔබට සේවාවෙන් ඉල්ලා සිටිය හැකිය.

ඔබගේ පවුලට සරිලන සේවාව කුමක්ද යනන සොයා ගැනීම සඳහා වූ හොඳම ක්‍රමය වන්නේ, දිගු දිවා සුරැකුම් සේවාවක් හෝ බාලාංශ සේවාවක් වෙත ගොස්, වට පිටාව සොයා බලා, බාලාංශ වැඩ සටහන මගින් ඔබගේ දරුවා හට ලබා දිය හැකි දෙය සම්බන්ධයෙන් අදාල ගුරුවරුන් සමග සාකච්ඡා කිරීමවේ.

## මාගේ දරුවා හට මෙතෙක් ඉංග්‍රීසි කථා කිරීමට නොහැකි නම් කුමක් සිදුවේද?

බාලාංශ ගුරුවරුන් සියළුම දරුවන් වැඩ සටහනට ඇතුලත් කරන බැවින්, ඉංග්‍රීසි කථා නොකරන දරුවන් හටද අනෙක් සෑම දරුවන් හටම ඇති ක්‍රීඩා කිරීමේ සහ ඉගෙනීමේ අවස්ථාවන් සමාන අවසථාවන් ඇත.

ඉංග්‍රීසි කථා නොකරන හෝ තරමක් ඉංග්‍රීසි කථා කරන දරුවන් හට අමතර උපකාර ලබාදීම සඳහා සමහර බාලාංශ සතුව ද්වි භාෂා ශික්ෂකයන් සිටී.

## බාලාංශ සඳහා කොපමණ මුදක් වැයවේද?

පාසැල් යාමට පෙර වසරේ සෑම දරුවෙකු හටම බාලාංශයේ සතියකට පැය 15 ක් සඳහා රජය මගින් අරමුදල් සපයයි. බොහේ සේවා මගින් රජය මගින් ලබා දෙන අරමුදලට අමතරව ගාස්තුවක් අය කරයි.



VICTORIA State Government | Education and Training

අමතර වියදම සම්බන්ධයෙන් අමතර පවුල් හට සහනාධාරයක් ලබා ගත හැකිවේ. උදාහරණ වශයෙන්, හෙල්ත් කෙයාර් කාඩ්පත් ඇති හෝ මානුෂික හිතවාදී වීසා බලපත්‍ර ඇති අය. වැඩිදුර විස්තර සඳහා බාලාංශ සේවාව සමඟ කථා කරන්න.

### මාගේ දරුවාව බාලාංශයකට ඇතුලත් කරන්නේ කෙසේද?

ඔබගේ දරුවාව යැවීමට කැමති බාලාංශ සේවාව ඔබ දන්නේ නම්, ඇතුලත් කිරීම සඳහා ඔවුන් සමග සම්බන්ධ වන්න. බොහෝ පළාත් පාලන ආයතන සතුව බාලාංශවලට ඇතුලත් කිරීමේ මධ්‍යම වැඩ සටහන් ඇති අතර ඔබ ප්‍රදේශයේ බාලාංශයකට ඇතුලත් කිරීම සඳහා ඔබගේ පළාත් පාලන ආයතනය සමග සම්බන්ධ වන්න, නැතිනම් ඔබගේ ප්‍රදේශයේ මාතෘ සහ ළමා සෞඛ්‍යය හෙදියගෙන් විමසන්න

බොහෝ බාලාංශ මගින් මීළඟ වසර සඳහා දරුවන් ඇතුලත් කර ගැනීම් සිදු කරන්නේ මෙම වසරේ මැද භාගයේදීය. බොහෝ බාලාංශ සඳහා බලා සිටීමේ ලේඛණයකට ඇතුලත් කරන බැවින් ඔබට මනාප වසරට ඇතුලත් කර ගැනීම සඳහා වැඩිපුරම අවස්ථාව ලබා ගැනීම සඳහා හැකි විගස ඔබගේ දරුවා ඇතුලත් කර ගැනීම කදිම අදහසකි.

## වැඩිදුර විස්තර සොයා ගන්න

### වෙබ් අඩවි

ඔබගේ පවුල සඳහා ගැලපෙන බාලාංශය සොයා ගැනීම සම්බන්ධ උපදෙස් ලබා ගන්න:

www.education.vic.gov.au/parents/childcare-kindergarten/Pages/default.aspx

ඔබගේ ප්‍රදේශයේ බාලාංශයක් සොයා ගැනීම:

www.education.vic.gov.au/findaservice/Home.aspx

### Telephone දුරකථන

| | |
|---|---|
| ඊසානදිග වික්ටෝරියා | 1300 333 231 |
| වයඹ වික්ටෝරියා | 1300 338 691 |
| ගිණිකොන වික්ටෝරියා | 1300 338 738 |
| නිරිතදිග වික්ටෝරියා | 1300 333 232 |

ඔබගේ භාෂාවෙන් උපකාර ලබා ගැනීම සඳහා:

- දුරකථන අංක 131 450 ඔස්සෙ ජාතික පරිවර්තන සහ තෝල්ක සේවාව (National Translating and Interpreting Service (TIS)) අමතන්න
- ඔබගේ කලාපයට අදාල අංකය අමතන ලෙ ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න (ඉහත බලන්න)
- ඔවුන් දුරකථන ඇමතුමේ රැඳී සිට පරිවර්තනය කරනු ඇත.